## ලංකා විදුලිබල මණ්ඩලය - 2017
-----------------------------------------

ලංකා විදුලිබල මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ ("ලංවිම") මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සීමාසහිත කෝල් (පුද්ගලික) සමාගම හැර අනෙකුත් පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා මා විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලද අතර සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන මා විසින් විගණනය කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම
---------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ ශ්‍රීලංමූවාප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලින් හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

2.2.1.1 සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ විගණක විසින් එහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් ඡේදයේ අඩංගු කරුණ ගැන විශේෂ අවධානය යොමුකර ඇත.

සමාගම මෙගාවොට් 500 ක ධාරිතාවක් සහිත ගල් අඟුරු බලාගාරයක් සංවර්ධනය කිරීමේ එකම පරමාර්ථයෙන් පවත්වාගෙන ගිය සාම්පූර් බලාගාරය එහි සංවර්ධන කටයුතු නවතා දමා ඇති අතර මීට පෙර ප්‍රාග්ධනීත කරන ලද වියදම් සමාලෝචිත වර්ෂය තුළදී කපාහැර ඇත. ඒ වෙනුවට ත්‍රිකුණාමලය විදුලිබල සමාගම විසින් සාම්පූර්හි එම ඉඩමේම මෙගා වොට් 50 ක ධාරිතාවයකින් යුත් සූර්ය බලශක්ති බලාගාරයක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද මෙගා වොට් 500 ක ධාරිතාවයකින් යුතු එල්එන්ජී බලාගාරයක් කෙරවලපිටියේ සංවර්ධනය කිරීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, මෙයින් ඇඟවෙන්නේ සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් ඇති බවට සැලකිය යුතු සැකයක් ජනිත වන බවයි.

2.2.1.2 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහතින් දක්වා ඇති එකිනෙක කරුණු මත මාවිසින් තත්ත්වාගණනය කරන ලද විගණන මතයන් පළකරන ලදී.

(අ) ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

(i) එකතුව රු.27,478,787 ක් වූ ලැබිය යුතු එකතු කිරීමේ අගය මත බදු ආර්ථික සේවා ගාස්තු සහ රඳවාගැනීමේ බදු සහ ගෙවිය යුතු රු. 11,703,151 ක් වූ ආදායම් බදු මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ අතර, අසාමාන්‍ය හර ශේෂයන් වූ රු.3,371,326 ක් හා රු.12,758,801 ක් පිළිවෙලින් ජාතිය ගොඩනැගීමේ බදු සහ අගය එකතු කිරීම් මත බදු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ණය හිමියන් යටතේ පෙන්වා තිබුණි. මෙම බදු ගණනය කිරීමේ විස්තර, අයබදු පැවසුම් වැනි ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කළ නොහැකි විය. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ශේෂ නිරවුල් කිරීමට සමාගම 2018 ඔක්තෝබර් 31 වනතුරුද ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව, වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේදී ආදායම් බදු වගකීම රු.65,474,540 කි. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව එය රු.4,046,601 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ආදායම් බදු වගකීම රු.61,427,939 කින් වැඩිපුර දක්වා තිබුණි.

(iii) සමාගම ලංකා විදුලි මණ්ඩලයට සපයන ලද ගල් අඟුරුවල වටිනාකම මත ආර්ථික සේවා ගාස්තු ගෙවීමේ වගකීමට බැඳී සිටි. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් රු.159,790,628 ක ප්‍රතිපාදනයක් කිරීමට සමාගම අපොහොසත් වී ඇත.

(iv) 2016 අංක 20 දරන එකතු කිරීමේ අගය මත බදු (සංශෝධන) පනත ප්‍රකාරව, 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගල්අඟුරු ආනයනය හා සැපයීම මත වූ එකතු කිරීමේ අගය මත බදු සඳහා ලබා දී තිබූ සහනය ඉවත් කර තිබුණි. එබැවින්, සමාගම ගල්අඟුරු ආනයනය හා සැපයීම සඳහා එකතු කිරීමේ අගය මත බදු ගෙවීමට බැඳී සිටි. කෙසේ වෙතත්, සමාගම යෙදවුම් හා නිමැවුම් අගය එකතු කිරීමේ බදු පිළිවෙලින් රු.5,071,823,613 ක් සහ රු.4,790,535,258 ක ගිණුම්ගත කර නොතිබුණි. තවද, රු.281,288,355 ක් වූ ඉඩ නොදෙන එකතු කිරීමේ අගය මත බදු, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා නොතිබුණි. ඒ හේතුකොට ගෙන විකුණුම් පිරිවැය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම ඉඩ නොදෙන එකතු කල අගය මත බදු මුදල සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ඉන්වොයිස් කර නොතිබුණි. එබැවින්, සමාගමේ ආදායම රු.281,288,355 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ඒ මත බදු වගකීම රු. 42,193,253 ක් ගිණුම්වල සටහන් කර නොතිබුණි.

(v) විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ විස්තරාත්මක උපලේඛනය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන 19 යටතේ ලංකා විදුලිබල මණ්ඩලයට රු.478,179,795 ක් ගෙවිය යුතු ලෙස ඇතුළත් වී ඇත. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල සටහන 10 අනුව, ගල් අඟුරු අඩුවෙන් බෙදාහැරීම හා වෙනත් ලැබිය යුතු මුදල් ලෙස ලංකා ගල් අඟුරු සමාගමේ උපයෝගී සමාගමක් වූ සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් අයවිය යුතු අනුරූපී මුදල ලෙස දක්වා ඇත්තේ රු.539,192,079 කි. එබැවින්, එකී සංඛ්‍යා අතර නොසැසඳු රු.61,012,284 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ගනුදෙනුවේ දින සිට වසර 5 ක් ගත වී ඇති නමුත් සමාගම එකී ලැබිය යුතු ශේෂය සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් අයකර ගැනීමට අපොහොසත් වී ඇත. ඉහත කී ශේෂය අයකර ගැනීමේ හැකියාව තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි වූ අතර සමාගම විසින් මූල්‍ය ප්‍රකාශවල සාධාරණ ඉදිරිපත් කිරීමට බලපෑමක් කළ හැකි එකී ලැබිය යුතු ශේෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

---

(i) සමාගම විසින් සීමාසහිත ඇම්ට්‍රෑඩ් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම සමඟ අළු හා යටි මඩ භාවිතා කොට සිමෙන්ති මත පදනම් ද්‍රව්‍ය නිශ්පාදනය කිරීම හා විකිණීම සඳහා 2012 ජූලි 27 දින ශ්‍රී ලංකාවේ බද්ධ ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුමකට එළඹෙන ලදී. මේ සඳහා සමාගම විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.7,364,447 ක ආයෝජනයක් කරන ලදී. කෙසේ වෙතත්, එකී ගිවිසුම අහෝසි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය 2014 මාර්තු 27 දින තීරණය කරන ලදී. මේ සඳහා දරන ලද පිරිවැය ආපසු අයකරගැනීමේ හැකියාව පිළිබඳව ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. මෙකී ආයෝජනය සම්බන්ධයෙන් යම් හානිකරණයක් හඳුනාගැනීම අවශ්‍ය වේ දැයි මට නිශ්චය කළ නොහැක.

(ii) ස්වාධීන සනාථ කිරීම් හෝ අනෙකුත් ගනුදෙනු උපකාරකයන්/ විධිමත් ඇගයීම්/ භෞතික තොග සත්‍යාපන වාර්තා නොමැති වීම හේතු කොටගෙන වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කෙරෙන ශේෂය රු.7,505,626 ක් වූ ඉන්වෙන්ට්‍රි කරුණ ආවරණයෙහි පැවැත්ම හා අගය කිරීම ගැන මට සෑහීමට පත්විය නොහැක.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම වාර්තා කර තිබූ රු.642,434 ක ශේෂය ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂයක් බව සහ සමාලෝචිත වර්ෂය සඳහා රඳවාගෙන තිබූ රු.438,231 පාරිතෝෂික මුදල 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය නොවන බවද නිරීක්ෂණය විය.

(iv) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 111-124 ඡේද අනුව සමූහය විසින් (අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මිනුම් පදනම හෝ පදනම් සහ (ආ) මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීමට අදාළව භාවිතා කරන ලද අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත්ව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. එවැනි ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(v) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 හි 49 ඡේදය ප්‍රකාරව සමූහය විසින් (අ) ඉකුත් කාලපරිච්ඡේද වැරදිවල ස්වභාවය, (ආ) ප්‍රායෝගිකව ඉදිරිපත් කරන ලද එක් එක් කාලපරිච්ඡේද ප්‍රමාණය (ඇ) ඉදිරිපත් කරන ලද මුල්ම කාලපරිච්ඡේදය ආරම්භයේ නිවැරදි කරන ලද මුදලද සහිතව ඉකුත් කාලපරිච්ඡේද වැරදි හෙළිදරව් කළ යුතුය. එවැනි හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(vi) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි ඡේද 12-14 සහ 15-20 අනුව සමූහය විසින් ප්‍රවර්තන බදු වගකීම/ වත්කම සහ විලම්භිත බදු වගකීම/ වත්කම අදාළ අයකිරීම/ වෙනස් වීම සමඟ එක් එක් මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, සමූහය එය 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශ සමඟ එය ගිණුම්ගත කර නොතිබුණි.

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 හි ඡේද 13, 14, 18, 19, 25 සහ 26 අනුව මිල අයකළාද නැද්ද යන්න නොසලකා සමූහය විසින් සම්පත් මාරු කිරීම් වාර්තා කරන ආස්ථිත්‍යය සහ සම්බන්ධිත පාර්ශවයන් අතර සේවාවන් හෝ බැඳීම් වැනි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එවැනි හෙළිදරව් කිරීම් කිසිවක් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි.

(viii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 හි 17 ඡේදය ප්‍රකාරව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ආස්ථිත්‍යයක කාර්යයන් පාලනය කිරීමට සෘජුව හෝ වක්‍රව සම්පූර්ණ අධිකාරී බලය හා වගකීම දරන ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන පුද්ගලයන්ට පහත සඳහන් ලෙස වර්ග කරනු ලබන එනම් (අ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ (ආ) පසු සේවා නියුක්ති ප්‍රතිලාභ (ඇ) අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ (ඇ) සමාප්ති ප්‍රතිලාභ සහ (ඉ) කොටස් පදනම් ගෙවීම් වැනි හානි පූරණයන් සමූහය විසින් හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි හෙළිදරව් කිරීමේ සටහනක් මූල්‍ය ප්‍රකාශනවල නොවීය.

## 2.2.2 ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං ගි ප්‍ර/ශ්‍රී ල මූ ප්‍ර වා ප්‍ර) වලට අනුකූල වීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 2 - ඉන්වෙන්ට්‍රි සහ ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපළ යන්ත්‍ර හා උපකරණ

ඉහත සඳහන් ප්‍රමිතවල ඇති ප්‍රතිපාදන අනුව ශ්‍රමය ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය ඒවාහි තථ්‍ය පිරිවැය මත අගය කළ යුතු නමුත් ඒ වෙනුවට මණ්ඩලයේ ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්වල ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය ප්‍රමිත පිරිවැය ක්‍රමය භාවිතා කොට අගය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, උද්ගත වූ එකතුව රු.5,918,929,637 ක් වූ වාසිදායක ද්‍රව්‍ය මිල විචලනය සහ ශ්‍රමය හා පොදුකාර්ය පිරිවැය අනුපාත විචලනය (rate variance) සහ එකතුව රු.1,053,069,877 ක් වූ අවාසි ගබඩා මිල විචලනය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළව ඉහළ මූල්‍යමය සම්බන්ධතාවක් තිබීම හේතුකොට ගෙන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්, වගකීම් සහ හිමිකමට සැලකිය යුතු බලපෑමක් කරනු ලැබේ. කෙසේ වෙතත්, එකී ප්‍රාග්ධන කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුකොටගෙන ඒ මත මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී ලබාගත නොහැකි විය.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

(i) ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයන් නිශ්චිත ප්‍රතිපත්ති තීරණයක් ලබා නොගෙන අතිරේක සාමාන්‍යාධිකාරී (උත්පාදනය) විසින් දෙන ලද උපදෙස් පරිදි රු.31,604,054 ක් හා රු.1,618,736,079 ක් වටිනා අමතර කොටස් පිළිවෙලින් මෙහෙයුම් වියදම් වශයෙන් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, එකී වර්ගීකරණයට භාවිතා කරන ලද පදනමෙහි සාධාරණත්වය විගණනයේදී පිළිගත නොහැක. තවද, වර්ගීකරණය සඳහා යොදාගත් පදනම ද මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් කර ඇති ආකාරයට ලංකා විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව පාවිච්චි කරනු ලබන සම්පූර්ණ ක්ෂය කරන ලද ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් පිරිවැය රු.23,932,093,328 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද විදුලි බලාගාර හතරක් ප්‍රත්‍යාගණනයකින් තොරව තවදුරටත් විදුලිය ජනනය කිරීම සඳහා යොදාගනු ලැබේ.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 27 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල විසින් මූල්‍ය උපකරණවල ආයෝජනය කරන ලද රු.2,312,756,993 ක් අයකර ගැනීම, එකී මූල්‍ය උපකරණ නොපැවතීම හේතුකොට ගෙන සැක සහිත වේ. ලංකා විදුලිබල මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු වන නිසා අසම්භාව්‍යතාවන් (තිබේ නම්) ගැන අවසාන වගකීම මණ්ඩලය සතු වේ. කෙසේ වෙතත්, මෙකී අසම්භාව්‍යතාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපාදනයක් කිරීම හෝ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබුණි.

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල විසින් ආයෝජනය කරන ලද රු.403,717,966 ක මුදල හා ඊට අදාළ රු.16,045,328 ක් වූ පොලිය අයකරගැනීම එකී මූල්‍ය උපකරණ නොපැවතීම හේතු කොට ගෙන සැකසහිත විය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් ගැලපීමක් හෝ ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

(ආ) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට අයත් මෝටර් රථ දෙකක් ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීම හේතු කොටගෙන 2017 දෙසැම්බර් 31 දිනට දේපල යන්ත්‍ර හා උපකරණවල ශේෂය සහ සමාලෝචිත වර්ෂයේදී දේපල, යන්ත්‍ර හා උපකරණ පාඩුව පිළිවෙලින් රු.14,605,980 කින් හා රු.2,086,567 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රු.1,473,735,676 ක් වූ හර ශේෂයක් (තොග ඌනතා) සහ රු.16,654,669 ක් වූ බැර ශේෂයක් (තොග අතිරික්ත) නිෂ්කාෂණය කිරීමකින් තොරව වසරකට අධික කාලයක් තොග ගැලපුම් ගිණුමේ රඳවා තිබුණි.

(ඈ) එකතුව රු.746,546,369 ක් වූ කොමිස් මුදල්, නිෂ්කාෂණ ගාස්තු ආදී විදේශ මිලදී ගැනීම්වලට අදාළ වියදම් 2013 වර්ෂයේ සිට අදාළ වියදම් ගිණුම්වලට හෝ වත්කම් ගිණුම්වලට අන්තර්ග්‍රහනය නොකොට ලක්විජය බලාගාරයේ මාර්ගස්ථ තොග ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) අංක 10/2434/423/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගන්නා ලද රු.159,184,187,965 ක් වූ ණය මුදල සහ ඊට අදාල පොලිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,398,152,185 ක මුදලක් හා 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.18,567,893,780 ක් ණය පොලී වශයෙන්ද ණය දුන් බැංකුවට ගෙවා තිබූ නමුත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී මුදල් නොගෙවා තිබූ අතර එහි ගිණුම්වල ඒ සඳහා ප්‍රතිපාදනයක් හෝ කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ පාඩුව රු.3,398,152,185 කින් අඩුවෙන් දැක්වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම් රු.21,966,045,965 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද රු.35,220,599 ක වියදම් ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබූ අතර එය ලැබිය යුතු මුදලක් ලෙස සලකා නොතිබූ හෙයින් සමාලෝචිත වර්ෂයේ පාඩුව එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2015 මාර්තු 19 දිනැති අංක 15/0228/613/012 අමාත්‍ය මණ්ඩලය ගෙන ඇති තීරණය අනුව එ.ජ.ඩො 5,412,000 ට සමාන රු.820,969,500 ක ණය මුදලක් ලැබී තිබුණු අතර ඒ සඳහා වූ රු.5,602,295 ක පොලිය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ වගකීම් හා පාඩුව පිළිවෙලින් රු.820,969,500 කින් හා රු.5,602,295 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද 2013 වර්ෂයට පෙර රාජ්‍ය ආයතනවලට සපයන ලද විදුලි ජනන යන්ත්‍ර, ඔසවන සහ වායුසමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම් යන කාර්යයන් එකී වැඩවල ඉන්වොයිසි වටිනාකම මත ගිණුම්ගත කරනවා වෙනුවට පිරිවැයට අගය කොට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් සහ රඳවාගත් ඉපැයීම් රු.66,987,761 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2.3 නොසැසඳු වෙනස්කම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස රු.49,468,844,000 ක් දක්වා ඇති අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ එදිනට මූල්‍ය ප්‍රකාශනවල විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස පෙන්වා ඇති අනුරූපි ශේෂය රු.50,255,066,432 ක් වූයෙන් එම ශේෂ දෙක අතර රු.786,222,430 ක වෙනසක් නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා පහත සඳහන් පරිදි පැහැදිලි කර ඇත.
"2013 සැප්තැම්බර් 30 දින මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් පැවැත් වූ රැස්වීමේදී ගන්නා ලද තීරණය ප්‍රකාරව, 2013 අප්‍රේල් 20 දින සිට බලපැවැත්වෙන පරිදි කල්පැනපු ඉන්වොයිසි වටිනාකම මත (ණය කාලයෙන් එහා) පොලී ගෙවීමට තීරණය කෙරුණි. කෙසේ වෙතත්, රු.753,610,829 ක් වූ ප්‍රමාද වූ පොලී ගෙවීම, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2013 අප්‍රේල් 20 දිනට පෙර මිලදී ගන්නා ලද ඉන්ධනවලට අදාළ වේ. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩලය වගකීමට බැඳී නැති හෙයින්, එකී වෙනස සංසන්දනය කිරීමක් අවශ්‍ය නොවේ."
කෙසේ වෙතත්, මෙකී මතභේදය 2013 වර්ෂයේ සිට අඛණ්ඩව විගණන වාර්තාවල පුන පුනා සඳහන් කරන ලද නමුත් 2017 දෙසැම්බර් 31 වන තුරු එය නිරාකරණය කර නොතිබුණි.

(ආ) බිල් කිරීමේ පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂ අත්හැරීම හේතුකොටගෙන 2017 දෙසැම්බර් 31 දිනට බෙදාහැරීමේ අංශ 1, 2, 3 හා 4 හි බිල්කිරීම් පද්ධතියේ දක්වා ඇති තොග වෙළඳ ණයගැතියන්ගේ ශේෂ හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූපී සංඛ්‍යාව අතර රු.331,154,817 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.18,203,663,608 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය හා තොග සැපයුම් යන දෙකටම අදාළ රු.3,826,334,673 ක ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවැති අතර එයින් රු.1,929,746,044 ක් වසර 5 කට අධික කාලයක් අය නොවී පැවතුණි. තවද රු.423,764,624 ක මුදලක් 2012 වර්ෂයේ සිට හඳුනා නොගත් ශේෂයක් ලෙස පැවතුණි.

(ආ) ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් (LECO) අයවිය යුතු රු.32,765,469 ක් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව වසර 5 කට අධික කාලයක් හිඟව පැවතුණි.

(ඇ) මාගේ ඉකුත් විගණන වාර්තාවලින් පුන පුනා පෙන්වා දී ඇතත්, එකතුව රු.2,505,397,073 ක් වූ පහත සඳහන් වෙනත් වෙනත් ලැබිය යුතු ගිණුම් ශේෂයන් 2017 දෙසැම්බර් 31 දිනට වසර 5 කට අධික කාලයක් අයකර නොගෙන පැවතුණි.

| ණයගැතියාගේ නම | මුදල | විස්තරය |
|---|---|---|
| | රු. | |
| මහා භාණ්ඩාගාරය | 225,000,000 | විදි ආලෝක කිරීම හා නඩත්තු සඳහා අයකර ගැනීම් පිරිවැය |
| සීමිත වුඩ් ගෲප් ගෑස් ටර්බයින් සමාගම | 8,264,352 | වුඩ් ගෲප් ගෑස් ටර්බයින් යන්ත්‍රයක් කොළඹ වරායේ සිට පන්නිපිටිය වැඩ බිමට ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රේලරයක් භාවිතා කිරීම වෙනුවෙන් "ෆිආගියෝලි ඉටැලි" වෙත කරන ලද ගෙවීම් |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවලපිටිය සංයුක්ත විදුලි බලාගාරය විවෘත කිරීමේ උත්සවයට කරන ලද ගෙවීම් |
| ශ්‍රී ලංකා තිරසර බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා ජල විදුලි සංවර්ධකයන්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද තීරුබදු ගැලපුම් |
| ඒ්ඒස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,964,445 | මිල වෙනස්කම් මත ගෙවන ලද අයකර ගත යුතු මුදල් |
| එකතුව | 2,505,397,073 | |

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ණයගැතියන් ලෙස පෙන්වා ඇති මහා භාණ්ඩාගාරය විසින් 2016 වර්ෂයේදී අය කරන ලද විශේෂ අයබදු රු.බිලියන 5 ට එරෙහිව නිකුත් කිරීමට එකඟ වූ භාණ්ඩාගාර බැඳුම්කර 2017 වර්ෂය අවසානය වනතුරුත් මණ්ඩලය විසින් ලබාගෙන නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය විය.

### (අ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත

#### (i) 47(1)(ආ) වගන්තිය

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාගෙන ඇති ණය පියවීම සඳහා මහා භාණ්ඩාගාරයේ නිදන් අරමුදලක් ස්ථාපිත කොට පවත්වා ගත යුතුය. මූල්‍ය ප්‍රකාශනවල මෙකී නිදන් අරමුදලේ ශේෂයක් පෙන්නුම් කළද එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. එකී සංචිත ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 17,447 ක් විය.

**(ii) 47(2)(අ) වගන්තිය**

------------------------

ලංකා විදුලිබල මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ක්ෂය සංචිත අරමුදලක් ස්ථාපිත කොට පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, එකී අවශ්‍යතාවට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශවල ක්ෂය සංචිතයක් ස්ථාපිත කොට 2000 දෙසැම්බර් 31 දින දක්වා ඊට වාර්ෂිකව රු.මිලියනයක් බැගින් මාරු කොට තිබුණු අතර ඉන් අනතුරුව කිසිදු චලනයක් සිදු වී නොතිබුණි. එකී දිනට රු.මිලියන 23 ක් සමුච්චිත වී තිබුණු අතර කිසිදු සමාලෝචනයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් තිබුණි.

**(iii) 47(2)(ආ) වගන්තිය**

------------------------

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන වැඩ එහි ආදායමින් මූල්‍යකරණය කිරීමේ කාර්යය සඳහා මූල්‍ය ස්ථායිතාව සහතික කර ගනිමින්හා ලංකා විදුලිබල මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන වෙනත් කාර්යයන් සඳහා පොදු සංචිතයක් මහා භාණ්ඩාගාරයේ ස්ථාපිත කොට පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, එකී අවශ්‍යතාවට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලය වෙනත් ප්‍රාග්ධන සංචිතයක් එහි මූල්‍ය ප්‍රකාශනවල ස්ථාපිත කොට එයද 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නැත. එකී සංචිත ගිණුමේ 2017 දෙසැම්බර් 31 දින ශේෂය රු.මිලියන 165.45 ක් විය.

**(iv) 1971 අංක 38 දරන මුදල් පනතේ 46 වගන්තිය හා 11 වැනි කොටසේ 11(අ) හා (ආ) වගන්ති**

------------------------------------------------------------------------------------

එක් එක් වර්ෂයක් අවසානයේදී ස්ථාවර වත්කම්වල මුළු දල වටිනාකමින් සියයට 0.1 ක දායකයක් 1989 වර්ෂයේ සිට රක්ෂණ එස්ක්‍රෝ අරමුදලට මාරු කරන බව දක්වා ඇති නමුත්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර ඇත්තේ රු.මිලියන 7,246 ක් පමණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි පනතේ 28(3) වගන්තිය නිශ්චිත කොට ඇති ආකාරයට පාරිභෝගික තැන්පතු වෙනුවෙන් පොලී ගෙවා නැත. 2017 වර්ෂය සඳහා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද රේට් ගණන් පදනම් කරගෙන විගණනයේදී කරන ලද ගණනය කිරීම අනුව ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලිය රු.මිලියන 1,163 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට නොගෙවන ලද සමුච්චිත පොලිය රු.මිලියන 1,963 ක් විය.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය අනුව, 2017 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය වූ රු.මිලියන 7,088 ක මුදල ආයෝජනය කර නොතිබුණි. තවද, එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ලංකා විදුලිබල මණ්ඩලය තුළ මෙහෙයවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සහ සමූහයේ මෙහෙයුම් කටයුතුවලින් පිළිවෙලින් රු.මිලියන 45,729 ක සහ රු.මිලියන 41,156 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් සිදු වී ඇති අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අලාභය පිළිවෙලින් රු.මිලියන 13,191 ක් හා රු.මිලියන 10,391 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 32,538 ක් හා රු.මිලියන 30,765 ක පිරිහීමක් නිරූපනය විය. මිල ඉහළ යාම හේතුකොට ගෙන ගල් අඟුරු පිරිවැය සියයට 86 කින් වැඩිවීම හා ගල්අඟුරු ආනයනය සඳහා එකතු කළ අගය මත බදු (VAT) පැනවීම එකී පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වෙතත්, එකතුව රු.මිලියන 63,741 ක් වූ සේවක පඩිනඩි, බදු වියදම සහ ක්ෂය සැලකිල්ලට ගත් විට ලංකා විදුලිබල මණ්ඩලයේ අගය එකතු කිරීම රු.මිලියන 26,210 ක් වූ අතර ඉකුත් වර්ෂය හා සසඳන විට එය රු.මිලියන 21,243 ක් හෙවත් සියයට 44 කින් අඩු විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමූහයේ 2017 දෙසැම්බර් 31 දිනට කාරක ප්‍රාග්ධන තත්ත්වය රු.මිලියන 29,813 ක සෘණ අගයක් ගෙන තිබූ අතර එය ඉකුත් වර්ෂය අවසානයේදී රු.මිලියන 15,056 ක ධන අගයක් ගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන තත්ත්වය සියයට 298 කින් පිරිහී තිබුණි. මෙකී පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 37,004 කින් වැඩිවීමයි. තවද, විදුලිබල මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී අයිරා පොලී රු.මිලියන 846 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එය සියයට 3,560 ක වැඩිවීමකි.

### 3.2.2 ස්කන්ධයට ණය

සමූහයේ අඛණ්ඩ පාඩු හේතුකොට ගෙන 2017 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ ශේෂය සියයට 9 කින් අඩු වී තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය අවසානයට සියයට 4 කින් අඩු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමූහයේ ස්කන්ධයට ණය අනුපාතය ඉකුත් වර්ෂයේ සියයට 51 සිට සමාලෝචිත වර්ෂයේ සියයට 60 දක්වා වැඩි වී තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට සමූහයේ යෙද වූ මුළු ප්‍රාග්ධනයෙන් රු.බිලියන 249 ක් හෙවත් සියයට 37 ක ණය ගැනීම්වලින් මූල්‍යායනය කර තිබුණි.

### 3.2.3 ලාභදායීත්වය

සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඒකක පිරිවැය රු.20.34 ක් වූ අතර ඊට අනුරූපව 2016 වර්ෂයේ එය රු.18.08 ක් විය. එහෙත් ඒකකයක් රු.16.26 ක සාමාන්‍ය මිලකට විකුණා ඇත. (ඉකුත් වර්ෂයේ සාමාන්‍ය විකුණුම් මිල ඒකකයකට රු.16.18 ක් විය). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක දළ පාඩුව රු.4.08 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ පාඩුව වූ රු.1.90 හා සැසඳීමේදී සියයට 114 ක වැඩිවීමකි. ගාස්තු ප්‍රභේදය සහ සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද විදුලිබල ඒකකයකට (kwh) දායකය ඉකුත් වර්ෂය හා සසඳා පහත වගුවෙහි දැක්වේ.

| | ගාස්තු ප්‍රභේදය | ඒකකයකට (kwh) දායකය | |
|---|---|---|---|
| | | **2017** | **2016** |
| | | රු. | රු. |
| - | ගෘහස්ත | (6.86) | (4.66) |
| - | ආගමික ස්ථාන | (13.13) | (10.93) |
| - | සාමාන්‍ය කටයුතු | 3.40 | 5.82 |
| - | හෝටල් | (2.61) | (0.34) |
| - | කර්මාන්ත | (5.57) | (3.45) |
| - | රජය | (2.08) | 0.26 |
| - | විදුලි පුද්ගලික සමාගමට තොග සැපයුම් | (4.55) | (2.31) |
| - | වීථි ආලෝකකරණය | (20.34) | (18.08) |
| - | ඒකකයකට දායකය | (4.08) | (1.90) |

ඒ අනුව, සාමාන්‍ය කටයුතු ගාස්තු ප්‍රභේදය පමණක් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මුළු දායකත්වයට ධනාත්මක දායකත්වයක් ලබා දී තිබුණි. ඉකුත් වර්ෂයේ ධනාත්මක දායකත්වයක් ලබාදුන් රාජ්‍ය ගාස්තු ප්‍රභේදය මෙම වර්ෂයේදී සෘණ දායකත්වයක් බවට පත් වී තිබුණි. කර්මාන්ත හා ගෘහස්ත ගාස්තු ප්‍රභේද සමාලෝචිත වර්ෂයේදී ඉහළම සෘණ දායකත්වයක් මුළු දායකත්වයට ලබා දී තිබූ අතර ආගමික, හෝටල්, රජය හා ලංකා විදුලි පුද්ගලික සමාගමට විකුණුම් හා වීදි ආලෝකකරණ යන ගාස්තු ප්‍රභේද ද අවාසිදායක දායකත්වයක් ලබා දී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 විදුලි උත්පාදනය හා උත්පාදන පිරිවැය (බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ පිරිවැය හැර)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලි බල මණ්ඩලයේ මූලික අරමුණ රටට අඩු පිරිවැයකට විදුලිබලය සැපයීම වුවත්, විදුලිය මිලදී ගැනීම් ගිවිසුම්වල අවාසිසහගත කොන්දේසි, තාප බලයෙන් විදුලිය උත්පාදනයට ඉතා ඉහළ පිරිවැයක් දැරීම සහ සුළං හා වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අඩු දායකත්වයක් ලැබීම මත විදුලිබල මණ්ඩලයට එකී අරමුණ සාක්ෂාත් කරගත නොහැකි විය. තවද, ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන සැලැස්මේ හා සම්ප්‍රේෂණ සැලැස්මේ අන්තර්ගත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාද වූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ අවම පිරිවැය අරමුණට අහිතකර ලෙස බලපෑ හදිසි විදුලිය මිලදී ගැනීම් (රු.මිලියන 26,628 ක් වටිනා ගිගාවොට් 1,240 ක් මිලදී ගැනීම) සිදුකර තිබුණි. 2017 වර්ෂයේ විදුලිය උත්පාදන තත්ත්වය ඉකුත් වසර හා සසඳා පහත දැක්වේ.

| ප්‍රභවය | 2017 | 2016 | මුළු උත්පාදනයට දායකත්ව ප්‍රතිශතය | |
|---|---|---|---|---|
| | GWh | GWh | 2017 | 2016 |
| ජලවිදුලි | 4,004 | 4,220 | 27 | 30 |
| තාප | 5,045 | 4,461 | 34 | 31 |
| ගල්අඟුරු | 5,103 | 5,047 | 35 | 36 |
| සුළං | 367 | 345 | 3 | 2 |
| අනෙකුත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 152 | 76 | 1 | 1 |
| එකතුව | 14,671 | 14,149 | 100 | 100 |

**(ආ) සෘජු පිරිවැය**

මෙම වර්ෂයේදී ගල් අඟුරුවලින් විදුලිය ජනනය කිරීම සැලකිය යුතු ලෙසින් ඉහළ නොගිය නමුත් ගල්අඟුරු විදුලි ජනන පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17,301 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ බව නිරීක්ෂණය විය. තවද, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂය සඳහා විදුලිය මිලදී ගැනීම් පිරිවැය හා ඉන්ධන පිරිවැය පිලිවෙලින් රු.මිලියන 7,502 කින් හා රු.මිලියන 7,768 කින් හෙවත් පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 15 කින් වැඩි වූ අතර තාප විදුලි ජනනය සමාලෝචිත වර්ෂයේදී වැඩිවූයේ සියයට 13 කින් පමණි. විදුලිය උත්පාදනය සබැඳි සෘජු පිරිවැය විස්තර පහත දැක්වේ.

| | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| | රු.මිලියන | ප්‍රතිශතය | රු.මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 57,842 | 27 | 50,074 | 28 |
| විදුලිය මිලදී ගැනීම් | 89,254 | 42 | 81,752 | 46 |
| ගල් අඟුරු | 37,505 | 18 | 20,204 | 11 |
| මෙහෙයුම් හා නඩත්තු | 11,727 | 6 | 12,083 | 7 |
| ක්ෂය | 14,476 | 7 | 14,797 | 8 |
| මුළු සෘජු පිරිවැය | 210,804 | 100 | 178,910 | 100 |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසර 35 ක ඵලදායී ආර්ථික ජීව කාලයක් සහිත 2005 වර්ෂයේදී රු.18,254,550 කට මිලදී ගන්නා ලද පරිනාමක (Transformers) දෙකක් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හඳුනා ගන්නා ලද කෙටි විද්‍යුත් පරිපථ තත්ත්වයන්ට ඔරොත්තු නොදීමේ හේතුව මත පිළිවෙලින් වසර 5 ක් හා වසර 7 ක් තුළදී අක්‍රීය වී ඉවත් කර තිබුණි. ඉන් අනතුරුව ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අපහරණය කිරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත්, මෙකී ගනුදෙනුව සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීමට සහ මෙම ගනුදෙනුවට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් 11 දින රු.7,221,707 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ඉන්සියුලේටර් 3000 ක් (Pin 33 kv) තත්ත්වයෙන් බාල වීම හේතුකොට ගෙන භාවිතා නොකර තිබූ අතර 2018 සැප්තැම්බර් 30 වන තුරුත් ප්‍රතිශ්ඨාපනය නොකර නිෂ්කාර්යව ගබඩාවේ පැවතුණි. මේ සම්බන්ධයෙන් ලබාගත් කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2016 පෙබරවාරි 26 දින ඉකුත් වී තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.52,550,929 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් 2017 අප්‍රේල් මාසයේදී විශේෂ විමර්ශනයක් කරන ලදී. කෙසේ වෙතත්, මෙකී ඌනතාවට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව 2018 සැප්තැම්බර් 30 වනතුරුත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් පවරා තිබුණි. (නඩු අංකය B/1164/15) තවද, මෙකී නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) 2006 නොවැම්බර් 20 දින සිට 2012 පෙබරවාරි 20 අතර කාලය තුළදී වත්කම් කළමනාකරණ (යන්ත්‍රාගාරය - Power Plant) අංශයේ සිදු වී ඇති රු.3,674,861 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් වූ විධිමත් විමර්ශනය අවසන් වී තිබූ නමුත් එම තොග ඌනතාවන්ට වගකිව යුතු පුද්ගලයට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන විටත් ඉක්මන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම වෙනත් කාර්යාලයකදී වංචාවක් සිදුකර තිබූ අතර එම වංචාවට අදාළ වටිනාකම ලෙස රු.99,155 ක් අයකර ගැනීමෙන් පසු ඔහුගේ රාජකාරී අත්හිටුවා ඇත.

(ඉ) රු.3,789,893 ක තොග ඌනතාවකට වගකිව යුතු නිලධාරියෙකු සම්බන්ධයෙන් පත්කරන ලද විමර්ශන කමිටුවක නිර්දේශය පරිදි එකී පාඩුව අයකර නොගෙන එකී නිලධාරියාට 2011 ඔක්තෝබර් 15 දින විශ්‍රාම යෑමට ඉඩ සලසා දී තිබුණි. තවද, ඉක්මන් ක්‍රියාමාර්ගයක් නොගෙන එකී ප්‍රමාණාත්මක වටිනාකම ගිණුම් පොත්වල ඇතුළත් වී තිබුණි.

(ඊ) රු.4,860,885 ක් වූ ආපදා, ප්‍රවාහන, උත්සව හා විශේෂ අත්තිකාරම් වැනි කාර්ය මණ්ඩල ණය, අයකර ගැනීමට කටයුතු නොකර හිඟව පැවතුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------------**

මුළු පාරිභෝගික ද්‍රව්‍ය තොගය වූ රු.17,936,845,512 කින් සියයට 11 ක් නියෝජනය වූ රු.2,051,605,881 ක වටිනා තොග හෙමින් චලනය වන, චලනය නොවන සහ හානියට පත් වූ තොග වශයෙන් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. මෙවැනි විශාල චලනය නොවන හා හෙමින් වැයවන තොග වශයෙන් පවත්වාගෙන යාම හානියට පත්වීම හා ධාරණ පිරිවැය වැඩිවීම, වංචා ආදියට හේතුකාරක විය හැක.

**4.4 අවිධිමත් ගනුදෙනු**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැටුප් ප්‍රතිශෝධන අවස්ථාවේදී 2007 දෙසැම්බර් 13 දින සහ සාමූහික ගිවිසුම සැලකිල්ලට ගන්න අවස්ථාවේදී 2015 මැයි 20 දින අමාත්‍ය මණ්ඩලය විසින් උපයන විට ගෙවීමේ බදු (PAYE TAX) වගකීම සේවකයන් වෙත පැවරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත්, අමාත්‍ය මණ්ඩලය ගත් එම තීරණවලට පටහැනිව 2010 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ විදුලිබල මණ්ඩලය විසින් උපයන විට ගෙවීම් අදාළ සේවකයින්ගේ වැටුප්වලින් අඩු

නොකොට රු.3,294,348,130 ක් මණ්ඩලය සතු අරමුදල්වලින් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එසේ ගෙවන ලද මුදල රු.676,508,227 ක් විය.

තවද, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනයේ නිශ්චිත කර ඇති මුදල් නොවන ප්‍රතිලාභවල වටිනාකම එක් එක් සේවකයාගේ උපයන විට බදු ගෙවීම් ගණනය කිරීමේදී ගණන් ගත යුතුය. කෙසේ වෙතත්, විදුලි බල මණ්ඩලය නිල නිවාස සැපයීම, වෙන්කළ නිවාස පුද්ගලික පාවිච්චිය සඳහා මෝටර් රථ ලබාදීම වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ එකී බදු ගණනයේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව, මණ්ඩලයේ අනුමැතිය මත ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට විවිධ කාර්ය මණ්ඩල දීමනා කලින් කලට ගෙවා ඇත. 2017 සහ 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 1,930 ක් සහ රු.මිලියන 1,222 ක් එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව සියයට 10 සිට සියයට 14 ක පරාසයක පොලී අනුපාත මත මෝටර් වාහන ණය ප්‍රදානය කළ යුතු වුවත් ලංකා විදුලිබල මණ්ඩලය සියයට 4.2 ක පොලී අනුපාතයක් මත වාහන ණය ප්‍රදානය කර තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය බරපතල ද්‍රවශීල ප්‍රශ්නවලට මුහුණ දී සිටියද කිසිදු පාලනයකින් තොරව කාර්ය මණ්ඩල ණය ගෙවන බව නිරීක්ෂණය විය.

## 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය ලංකා විදුලි පුද්ගලික සමාගමට විදුලිය විකුණනු ලබන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් වර්ෂ කීපයක සිට ඉන්ධන මිලදී ගන්නා නමුත් එකී ආයතන දෙක අතර මනා මෙහෙයුම් ක්‍රියාවලියක් සහතික වීම සඳහා ආයතන දෙක සමඟ විකුණුම් ගිවිසුමක් සහ මිලදී ගැනීම් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) උප ණය ගිවිසුම්වල කොන්දේසි අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.2,171,027,353 ක් වූ පොලී මුදලක් සහ එකී පොලී ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් ගෙවිය යුතු සියයට 1 සිට සියයට 2 ක පරාසයකින් යුතු අතිරේක වාර්ෂික පොලියක් මහා භාණ්ඩාගාරයට ගෙවා නොතිබුණි. තවද, එකතු වටිනාකම රු.13,090,107,000 ක් වූ උප ණය 4 කට අදාළ ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

කාලීනව අරමුදල් උපයෝගී නොකිරීම හේතු කොටගෙන විදේශ අරමුදල් භාවිතා කොට ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් ණය මුදල්වලින් 2017 වර්ෂයේදී රු. 41,829,697 ක් අදාළ ණයදීම් ආයතන මඟින් බැඳීම් ගාස්තු වශයෙන් අඩු කරගෙන තිබුණි.

## 4.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටිය දීර්ඝ කාලයක් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) මානව සම්පත් අංශයේ ප්‍රධානම තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්ය මණ්ඩල) වුවත්, එකී තනතුරට අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද පත්කිරීම් හා උසස් කිරීමේ පරිපාටිය තුළ නිශ්චය කොට නොතිබුණු අතර එකී තනතුරු විශේෂයෙන් විදුලි ඉංජිනේරු වැනි වෙනත් සේවාවලටත් විවෘත වී තිබුණි.

(ඇ) පවත්නා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව මුළු මානව සම්පත් නිලධාරී තනතුරු සංඛ්‍යාවෙන් සියයට 50 ක් බාහිරින් පුරවනු ලබන අතර එම ප්‍රතිශතය ක්‍රමානුකූලව වාර්ෂිකව සියයට 85 දක්වා වැඩිකිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩල ඉතිහාසයේ දීර්ඝ කාලයක් තිස්සේ ඉංජිනේරුවරුන් දෙදෙනෙකු අංශ ප්‍රධානී තනතුරුවල කාර්යයන් ආවරණය කරන හෙයින් උසස් කිරීමේ පරිපාටිය තුළ එසේ බාහිරව පත්කරන ලද සේවකයින්ට පැහැදිලි උසස් වීම් මාර්ගයක් ඇති බවට නිරීක්ෂණය නොවීය.

(ඇ) මානව සම්පත් කළමනකරු සහ මානව සම්පත් නිලධාරී තනතුරුවලට ඍජු පත්කිරීම්වලදී අවශ්‍ය සුදුසුකම වන්නේ සේවකයින් 100 කට වඩා සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 6 ක පළපුරුද්ද වන නමුත් සිටින විශාල සේවක සංඛ්‍යාව සමඟ සැසඳීමේදී එය ලංකා විදුලි බල මණ්ඩලය කාර්ය මණ්ඩලය හැසිරවීමේ අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවේ.

## 5. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම

එක්සත් ජාතීන් විසින් හඳුන්වාදෙන ලද "2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය" හි සඳහන් අභිමතාර්ථ 17 න් 7 වැනි අභිමාර්ථය වන්නේ "දැරිය හැකි විශ්වාසදායක, තිරසර හා නවීන බලශක්ති සේවාවන්ට ප්‍රවේශය තහවුරු කිරීම" වන අතර එකී අභිමතාර්ථය ලංකා විදුලිබල මණ්ඩලයේ විෂය පථයට ඇතුළත් වේ. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩලය 2030 වන විට එකී අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම තහවුරු කරගැනීමේ වගකීම දරයි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලය මෙකී අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමට ඉලක්ක සහ කඩඉම් (milestone) තවම හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 සමාජ වගකීම්

ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2017 ජූලි සිට පළාත් පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර නොතිබුණි.

## 6.2 නොවිසඳුනු විගණන ඡේද

ඉකුත් විගණන වාර්තාවල දක්වා තිබූ විගණන ඡේද 32 ක් සමාලෝචිත වර්ෂයේදී ද නොවිසඳා ඉදිරියට ගෙනගොස් තිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විටින් විට මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| විෂය | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | (i) බෙදාහැරීම් අංශවල ප්‍රාග්ධන වැඩ නිමකිරීමේ දීර්ඝ ප්‍රමාදයන්<br>(ii) දිවයින පුරා විසිරී ඇති ලංකා විදුලිබල මණ්ඩලය සතු ඉඩම් සමීක්ෂණය කිරීම, ඇගයීම හා ආරක්ෂාව ඉක්මන් කිරීම.<br>(iii) වාහන සඳහා වූ දත්ත සමුදාය යාවත්කාලීනව පවත්වාගෙන යාම. |
| (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් කාලීනව අයකර ගැනීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | අස්තිත්වයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වූ භූමිකාව හා ප්‍රමාණය අනුව මානව සම්පත් කළමනාකරණය |
| (ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය | (i) තොග වාර්තා විධිමත්ව පවත්වාගෙන යාම<br>(ii) තොග ඌනතා හා අතිරික්තතා මඟහරවා ගැනීම සඳහා ගල්අඟුරු තොග හැසිරවීමට සුදුසු පාලන ක්‍රම ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම. |
| (ඉ) ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය | (i) නියමිත කාලසීමාව ඇතුළත ව්‍යාපෘති නිමකිරීම.<br>(ii) ඉංජිනේරු ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීම. |
| (ඊ) ගිණුම්කරණ පද්ධතිය | ගිණුම්කරණ පද්ධතියේ පවත්නා අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට අඛණ්ඩව නැවත ප්‍රකාශ (Restate) කර තිබුණි. |